ඉන්දිය මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>පාර්ලිමේන්තු සාමාජිකයන් සහ නිලධාරීන් සඳහා ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනයේ පළමු ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන</u>**

ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා නවදිල්ලියේ පිහිටි ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනයේ පවත්වන පළමු ධාරිතා සංවර්ධන වැඩසටහනට සහභාගී වීම සඳහා මෙම සතියේ දී ඉන්දියාව සඳහා පිටත් වීමට නියමිත 24 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායම හමු විය.

2. මහ කොමසාරිස්තුමා විසින් නියෝජ්‍ය කතානායක වෛද්‍ය රිස්වි සාලි මහතා ප්‍රමුඛ විවිධ පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 20 දෙනෙකුගෙන් සහ පාර්ලිමේන්තු මහ ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත මෙම නියෝජිත පිරිස ඉන්දියා හවුස් හිදී පිළිගන්නා ලදී.

3. 2025 මැයි 26-30 දක්වා සතියක් පුරා පැවැත්වෙන මෙම වැඩසටහනට නීතිමය සහ අයවැය ක්‍රියාදාමයන්, පාර්ලිමේන්තු කමිටු ක්‍රමවේදය සහ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් දෙක අතර වෙනත් අදාළ කරුණු සම්බන්ධයෙන් මනා පිළිවෙත් බෙදාහදා ගැනීම වැනි විවිධ කරුණු ඇතුළත් වනු ඇත. ඉන්දියාවේ ගත කරන කාලය තුළ ඩිජිටල්, තොරතුරු තාක්ෂණය, බලශක්තිය සහ නාගරික සංවර්ධනය වැනි අංශවල විවිධ ක්ෂේත්‍ර චාරිකා සහ අන්තර්ක්‍රියා තුළින් ඉන්දිය කලාව සහ සංස්කෘතිය මෙන්ම ඉන්දිය ආර්ථිකය තුළ සිදු වූ පරිවර්තනය දැක බලා ගැනීමේ අවස්ථාව ද හිමි වනු ඇත.

4. 2025 අප්‍රේල් මාසයේදී අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලංකාවේ වෘත්තිකයන් සඳහා විශේෂයෙන්ම සකසන ලද පුහුණු අවස්ථා 700ක් ලබා දෙන බවට ප්‍රකාශ කළ අතර ඒ අනුව මෙම වැඩසටහන පැවැත්වේ. ව්‍යවසායකත්වය, ක්‍රීඩා, මාධ්‍ය සහ සිනමා වැනි විවිධ ක්ෂේත්‍රවල පුහුණු අවස්ථා මෙයට ඇතුළත් වේ. මෙම පුහුණු අවස්ථා 700 ප්‍රකාශයට පත් කරන ලද්දේ 2024 දෙසැම්බර් මාසයේදී ඉන්දියාවේ යහපාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයන් සඳහා පිරිනමන පුහුණු අවස්ථා 1500ට අමතරව ය.

****

***කොළඹ***
***2025 මැයි 21***